15 වන පිටුවෙන් (අදිසි)

දෙදෙනා මුර කුඩුවට යන අතර වාහනය පිටව යන්නේ දූවිලි වළාවක් අවුස්සමින් ය. සුනන්ද කල්පනාවෙන් බරවූ සිතින් එදෙස බලා සිටියි.

"මහත්තයා අද එන්නෙ නැහැ නේද සුනන්ද..?" වින්ධ්‍යා කතාව වෙනතකට හරවන්නට උත්සාහ කරයි. සුනන්ද සිනා සී ඇය දෙස බලයි. ".. ඇයි හිනාවෙන්නෙ..?" සුනන්ද පිළිතුරක් දෙන්නට පෙර ම වින්ධ්‍යා නැවත අසයි.

"ගෙදර නෝනට වඩා මං කොහොමද දන්නෙ මහත්තයගෙ ගමන් බිමන් ගැන...?"

වින්ධ්‍යා ඉංග්‍රිසි සඟරාවේ මුල් පිටුවේ සිටින රුවැති යුවතිය දෙස බලා සිටියි. ඇගෙ සිනාවේ සුන්දරත්වයට යටින් තේරුම් ගත නොහැකි ගුප්ත වේදනාවක් සැඟව ඇතැයි වින්ධ්‍යාට සිතෙයි. මේ සිනාව ව්‍යාජයක් නම් එහි ඇති සුන්දරත්වය කුමක් ද?

වින්ධ්‍යා සුසුමක් හෙළයි. එය ඇයට පිටුපා සිටින සුනන්දට නොපෙනෙයි.

"ගෙදර නෝනා නොදන්න හුඟක් දේවල් සුනන්ද දන්න බව මං දන්නවා.. මං ඒව ඔයාගෙන් අහන්නැතුව ඉන්නෙ ඔයා අපහසුවකට ලක් කරන්න අකමැති නිසා..."

සුනන්ද දොර වෙතින් මෑත්ව පැමිණ පුටුවේ වාඩි වෙයි. ඔහු හිස ඔසවා ඇය දෙස බලයි. ඇගේ ඇස් කඳුළකින් තෙත්ව ඇතැයි ඔහුට සිතෙයි.

"මං දන්න දෙයක් නැහැ මැඩම්... "

"බොරු කාරයා.. දන්නවද..? ඔයාට බොරු කියන්න තේරෙන්නෙ නැහැ.. අන්තිම අසාර්ථ කයි"

වරදකාරී සිතුවිල්ල සුනන්ද ගේ සිත පීඩාවට පත් කරයි. රණසිංහ ගේ ජීවිතයේ තමා දන්නා බොහෝ රහස් කිසි දිනෙක කිසිවකුට හෙළිදරව් කළ නොහැකි ඒවා බව ඔහු දනියි. ඒ සියල්ල එළිදරව් වීම යනු රණසිංහ ගේ ගමනේ අවසානයම වනු ඇත. එසේ කරන්නට සිත එකඟ කරගන්නට සුනන්ද ට නොහැකි ය.

"ඉස්සර කාලෙ රජ්ජුරුවන්ගෙ වස්තුව ගුහාවකට දාලා ඒවා ආරක්ෂා කරන්න බහිරවයෙක් දානවා.. අනේ ඒ බහිරවයට ලැබෙන කිසිම දෙයක් නෑ.. ඒ වුණාට ඒකා අර දේපළ සදාකල් රකිනවා.. සුනන්දයියත් බහිරවයෙක් වගෙයි... ඔයා මේ මනුස්සයගෙන් ලබා ගත්ත දෙයක් නැති බව මං දන්නවා.. ඔයා ලබා ගත්ත එකම දේ වත්තෙ කොල්ලො කෙල්ලන්ට රස්සාවල් ටිකක් අරන් දුන්න එක විතරයි... මන්ත්‍රීතුමාට උදව් කළ හැමෝම ඒවට ප්‍රති උපකාර ගත්තෙ සිය දහස් ගුණ වලින්.. ඒත් ඔයා කවදාවත් කිසිම දෙයක් ඉල්ලලා නැහැ.. අරගෙනත් නැහැ.. ඉස්සරහට ගනියි කියලා මට හිතෙන්නෙත් නැහැ.. කිසිම ප්‍රති උපකාරයක් බලාපොරොත්තු නොවී ඔයා මන්ත්‍රීතුමාගෙ හෙවණැල්ල වගේ ළඟ ඉන්නවා.. ඇයි මේ තරම් කැපවීමක් කියලා මට තේරුම් ගන්න බැහැ.."

එය තමාට ද තේරුම් ගත නොහැකි ප්‍රශ්නයක් බව සුනන්ද ද දනියි.

"කෙනෙකුට මං උපකාරයක් කරනකොට නැවත යමක් බලාපොරොත්තු වෙන්නෙ නැහැ මැඩම්.." ඔහු කියන්නේ ඇය දෙස බලාගත්වනම ය. ඇගේ ඇස් තමා වෙතම යොමුව තිබෙණු දකින විට ඔහු බිම බලා ගනියි.

"උපකාරය කරන කෙනා බලාපොරොත්තු නොවුණට උපකාර ලබන කෙනාට යුතුකමක් තියෙනවා හොයලා බලලා උපකාරයක් කරන්න.. ඒ යුතුකම මග ඇරෙනවා දකින කොට මට දුකයි.. මිනිස්සුන්ගෙ ඇහැට ඇඟිල්ලෙන් ඇනලා යුතුකම් පෙන්නලා දෙන්න ඕනෙ නැහැ.. එහෙම පෙන්නලා දීලා ලබා ගන්න දේවලින් ඇති වැඩකුත් නැහැ.. ඒත් සුනන්දයියා මං දවසක ඔයා වෙනුවෙන් යමක් කරනවා.. එහෙම නොකළොත් මට මගේ හිත හදා ගන්න බැරි වෙනවා.."

සුනන්ද කතාවකින් තොරවම පඩි පෙළ බසියි. කල්පනා කරන්නට බොහෝ දේ සිතේ තෙරපී ඇත. යන්නට අවසරයක් වින්ධ්‍යා වෙතින් ලබා නොගත් බව ඔහුට සිහිපත් වන්නේ මිදුලට ද පා තැබුවාට පසුව ය. ඇය දොරකඩට වී බලා සිටින බව ඔහු දකින්නේ ආපසු හැරී බලන විට ය. ඔහු හැරී බලනු ඇතැයි ඇය දැන සිටියා සේ ය.

"මට හෙට උදේ නුවර යන්න ඕනෙ.. " ඈ කියයි. ඔහු ප්‍රශ්නාර්ථයක් රැඳුණ ඇසින් ඇය දෙස බලයි.

"මල්ලි ගියේ හිත හොඳින් නෙවෙයි.. මගේ හිතට හරි නැහැ.. අපි බැන්දත් හරි මල්ලි ඔය උදව්වක් ඉල්ලගෙන ආවමයි.. අම්මලා මොනා හිතනවද මන්දා.."

"ටෙලිෆෝන් කරන්න තිබුණානෙ.."

"නෑ.. මට මුණ ගැහිලම කතා කරන්න ඕනෙ.. මට තනියම යන්න බෑ.. ඔයාට පුලුවන්ද කා එක ඩ්‍රයිව් කරන්න..?"

ඔහු පිළිතුරක් දෙන්නට කාලය ගනියි.

"ඔය හැටි කල්පනා කරන්න ඕනෙ නෑ.. මං මහත්තයට කෝල් කරලා කියන්නං මං ඔයා එක්ක යනවා කියලා.." ඇගේ කටහඬෙහි ඇති උපහාසය ඔහු සිතේ ඇති කරන්නේ ලජ්ජාවකි.

"මං එන්නං.."

"තෑන්ක් යූ.. " ඇගේ සිනාව පියකරු ය. ඔහු ප්‍රති සිනාවකින් පිළිතුරු දෙයි.

"මං එන්නං.. ඒත් මට කියනවද ටෙලිෆෝන් කෝල් එකකින් විසඳා ගන්න පුලුවන් දෙයක් වෙනුවෙන් මෙච්චර දුරක් යන්න හදන්නෙ ඇයි කියල ...?"

"කාරණා දෙකක් නිසා.. අම්ම අප්පච්චි දැක ගන්න එක තරම්... උපන්දා ඉඳලා දුව පැනපු ගෙදර දවසක් ගත කරන එක තරම් සතුටක් තවත් නෑ.. හතර පැත්තෙන්ම මුරකාවල් දාපු මේ හිර කඳවුරට වඩා එතැන හරිම සැපයි.. අනික කෙනෙකුට යමක් තේරුම් කරන කොට ඇස් දෙක දිහා බලා ගෙන කතා කරන්න මං කැමතියි.. එයා මගේ ඇස් දිහා බලා ඉන්නවටත් මං කැමතියි.. එතකොට එයාට තේරෙනවා මං ඒ දේ කියන්නෙ අවංකවමයි කියලා.. ඔයා දන්නවද...? ඇස් වලින් බොරු කියන්න බෑ.."

ඔහු සිනා සී ආපසු හැරෙයි. සිතට සැහැල්ලුවක් සතුටක් දැනෙයි. ආපසු එන්නට මෝටර් සයිකලයට නගින අතර ඔහුට ඇගේ කතාව නැවත සිහිපත් වෙයි.

සැබෑවකි. ඇයට ඇස් වලින් කතා කරන්නට හැකි ය.

ලබන කලාපයට

## රෝහණ වීරසිංහයන්ට වෙබ් අඩවියක්

සංගීතඥ රෝහණ වීරසිංහයන් වෙනුවෙන් නිමවෙමින් බවතින වෙබ් අඩවිය සඳහා දත්ත රැස් කිරීම දැන් අරඹා ඇත. මේ වෙබ් අඩවියට ඇතුල් කිරීම සඳහා එතුමන් වෙතින් සංගීතය නිර්මාණය කරගත් දෙස් විදෙස් සියලුම ගායක ගායිකාවන් ඒ ඒ ගීත පිළිබඳ විස්තර (ගීතය - ගායකයා/ගායිකාව- ගීත රචකයා) පහත දක්වෙන ඊමේල් ලිපිනයට එවන්න.



shakyaevents@gmail.com

1/5 Wilga Court,
Noble Park, Vic
3174





